(7)

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/General/2022 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date: 27. 09. 2022 |

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු වෙත,

**සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු පවුල් / තැනැත්තන් හඳුනා ගැනීම - 2022**

ඉහත වැඩසටහනට අදාළව සුභසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු පවුල් / තැනැත්තන් හඳුනා ගැනීම සඳහා අයදුම්පත් භාර ගැනීම දැනට ආරම්භ කර ඇත. මෙහිදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබුණු අයදුම්පත් ප්‍රමාණයෙන් දත්ත පද්ධතියට ඇතුළත් නොකළ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු සතිපතා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත ලබා ගැනීමට අවශ්‍ය වී ඇත.

02. ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අයදුම්පත් ලැබීමේ ක්‍රියාවලිය පහත පියවර ඔස්සේ අධීක්ෂණය කරමින් එහි ප්‍රගතිය සතිපතා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත වාර්තා කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

1) ග්‍රාම නිළධාරි / සමෘද්ධි සංවර්ධන නිළධාරි / සමාජ සේවා නිළධාරි / වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිළධාරි හෝ වෙනත් නිලධාරියෙකු හරහා හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකක වෙත ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් ලබා ගැනීම.

2) ඒ ඒ ග්‍රාම නිළධාරි වසම් අනුව ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකක හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා ගැනීම.

3) දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ලටම අදාළව තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත e-mail මඟින් (welfarebenefitboard2016@gmail.com) දැනුම් දීම.

03. ඉහත සඳහන් ක්‍රමවේදය ඔස්සේ සුබසාධක ප්‍රතිලාභ වැඩසටහනෙහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා තොරතුරු වාර්තා කිරීම සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

බී. විජයරත්න

සභාපති / කොමසාරිස්

පිටපත් - සියලුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත - කරු අ.ක.ස

කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk